# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2507/02 - 2026 සැප්තැම්බර් මස 21 වැනි සඳුදා - 2026.09.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථාව

**05 වන සංශෝධනය**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධිත 2014 ඔක්තෝබර් මස 23 දිනැති අංක 1885/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 සැප්තැම්බර් මස 14 දින.

**I කොටස**

සංශෝධන අංක 01 - 2019 අප්‍රේල් මස 22 වැනි දින හා අංක 2120/2 *අති විශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 02 - 2021 නොවැම්බර් මස 24 වැනි දින හා අංක 2255/14 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 03 - 2025 ජූලි මස 08 වැනි දින හා අංක 2444/21 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*
සංශෝධන අංක 04 - 2026 ජුනි මස 19 වැනි දින හා අංක 2493/61 *අතිවිශෙෂ ගැසට් පත්‍රය*

**II කොටස**

**13.8** “අධ්‍යාපනවේදී උපාධිධාරියා” යනුවෙන් අදහස් කරන්නේ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති හෝ වෙනත් විශේෂ පාර්ලිමේන්තු පනත් මඟින් පිහිටුවා ඇති උපාධි පිරිනමන ආයතන/ විශ්වවිද්‍යාල මඟින් හෝ ලබා ගත් පහත නිර්ණායකයන්ගෙන් සමන්විත අධ්‍යාපනවේදී උපාධි සහතිකයක් ලත් පුද්ගලයෙකු වේ.

i. වසර 04 ක පූර්ණකාලීන onsite (මාර්ගගත නොවන) උපාධි පාඨමාලාවක් වීම.

1A - G 47963— 04 (2026/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ii. උපාධි පාඨමාලාවේ අවම වශයෙන් සන්ධාර 120 (120 Credits) සම්පූර්ණ කළ යුතු වීම.

iii. රජයේ ජාතික හෝ පළාත් පාසලක හෝ රජයේ අනුමත පෞද්ගලික පාසලක හෝ අවම වශයෙන් සති 10 ක ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සම්පූර්ණ කර තිබීම හා එම ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සුදුසුකම් සහිත අධීක්ෂණයක්/ අධීක්ෂණ මණ්ඩලයක් යටතේ සිදු කර තිබීම.

iv. උපාධි පාඨමාලාව තුළ අවම වශයෙන් සන්ධාර 06ක් වත් සම්පූර්ණ කරන පර්යේෂණ නිබන්ධනයක්/ වාර්තාවක් සම්පූර්ණ කර තිබීම.

EOG 09 - 0378